# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2280/30 - 2022 මැයි මස 18 වැනි බදාදා - 2022.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. බී. 94/47 (VIII)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "ඓතිහාසික මැදගම නිකසලානුවර මහාගිරි චෛතියාරාම විහාර ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත්කරනු ලැබූ "ඓතිහාසික මැදගම නිකසලානුර මහාගිරි චෛතියාරාම විහාර ප්‍රදේශය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ දී ය.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

***ඓතිහාසික මැදගම නිකසලානුවර මහාගිරි චෛතියාරාම රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර - නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1375 - මැදගම ග්‍රාම නිලධාරී වසමේ මැදගම ග්‍රාමයෙහි පිහිටි ඉඩම සර්වේයර් ජනරාල්වරයා විසින් සකසන ලද 2020 ජූනි මස 29 වන දිනැති කේයු/පීඩීඊ/2020/70 දරන පිඹුරේ නිරූපිත කැබලි අක්ෂර ඊ (හෙක්ටයාර් 14.1307) සහ කැබලි අක්ෂර එල් (හෙක්ටයාර 0.0714) යන කැබලිවලින් සමන්විත හෙක්ටයාර 14.2021ක විශාලත්වයෙන් යුක්ත පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :

**කැබලි අක්ෂර : ඊ**

*උතුරට* : අ.ග.පි. 2233හි කැබලි අංක 113 ;
*නැගෙනහිරට* : කැබලි අක්ෂර එච්. අ.ග.පි 2233හි කැබලි අංක 123, කැබලි අංක 124, කැබලි අංක 126, කැබලි අංක 128, කැබලි අංක 158ඩී, කැබලි අංක 123 සහ කැබලි අංක 181 ;
*දකුණට* : අ.ග.පි 2233 හි කැබලි අංක 123, කැබලි අංක 181 වන බිම් කැබලි සහ කඳුබොඩගම (අ.ග.පි 2232) ;
*බටහිරට* : කැකුණගහකොටුව ගම (අ.ග.පි 1695)

**කැබලි අක්ෂර : එල්**

*උතුරට* : කැබලි අක්ෂර ඊ සහ අ.ග.පි 2233 හි කැබලි අංක 113 ;
*නැගෙනහිරට* : අ.ග.පි 2233 හි කැබලි අංක 113 ;
*දකුණට* : කැබලි අක්ෂර ඊ ;
*බටහිරට* : කැබලි අක්ෂර ඊ.

EOG 05 - 0088/1

---

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්ති මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "ගිරිඋල්ල මැද්දෙපොල රජමහා විහාර පූජා භූමිය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන "ගිරිඋල්ල මැද්දෙපොල රජමහා විහාර පූජා භූමිය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවටත් විධාන කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ගිරිඋල්ල මැද්දෙපොල රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේයර් ජනරාල්ගේ 2018 සැප්තැම්බර් මස 07 දිනැති අංක Ku/PNN/2017/039 දරන අනුරේඛනයේ දැක්වෙන වයඹ පළාතේ, කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, මැද පත්තුව නැගෙනහිර කෝරළේ සුළු කොට්ඨාසයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1568 - සියඹලාවලාන ග්‍රාම නිලධාරී වසමේ, සියඹලාවලාන ග්‍රාමයේ පිහිටි කැබලි අංක 124 (හෙක්ටයාර් 0.5009), අංක 1565 - මල්ගමුව ග්‍රාම නිලධාරී වසමේ මල්ගමුව ග්‍රාමයේ පිහිටි කැබලි අංක 127 (හෙක්ටයාර් 15.6059) සහ අංක 1569

- මැද්දෙපොළ ග්‍රාම නිලධාරි වසමේ, මැද්දෙපොළ ග්‍රාමයේ පිහිටි කැබලි අංක 386 (හෙක්ටයාර් 10.4532) වලින් නිරූපිත හෙක්ටයාර් 26.56ක විශාලත්වයෙන් යුක්ත පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :

**කැබලි අංක : 124 - ගල්බෙම්මලන්ගහහේන**

*උතුරට* : කැබලි අංක 26 සහ අ.ග.පි. 386 ;
*නැගෙනහිරට* : අ.ග.පි. 386 සහ අ.ග.පි. 381 ;
*දකුණට* : මාර්ගය ;
*බටහිරට* : මාර්ගය සහ කැබලි අංක 26.

**කැබලි අංක : 127 - කෝන්ගොල්ලේ වතුයාය, සිරිඋල්ලේකඩමන්ඩිය, හොරගස්යායේ මූකලාන**

*උතුරට* : අ.ග.පි. 386 ;
*නැගෙනහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) ;
*දකුණට* : කැබලි අංක 3 සහ කැබලි අංක 4 ;
*බටහිරට* : කැබලි අංක 4 සහ අ.ග.පි. 374.

**කැබලි අංක : 386 - බුලුගහමුල වත්ත, කෝන්ගහමුල වත්ත, විහාරකන්දේ කැලේ, විහාර කන්ද**

*උතුරට* : කැබලි අංක 8, 10, 11A, 11B, 12A, 14A, 14B සහ 15 ;
*නැගෙනහිරට* : කැබලි අංක 12 සහ මාර්ගය ;
*දකුණට* : අ.ග.පි. 381 සහ අ.ග.පි. 374 ;
*බටහිරට* : මාර්ගය.

EOG 05 - 0088/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.